**ලංකා විදුලිබල මණ්ඩලය - 2017**

**-------------------------------------**

2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති හා අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ලංකා විදුලිබල මණ්ඩලයේ ("ලංවිම") මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1969 අංක 31 දරන පනතින් සංශෝධිත 1969 අංක 17 දරන ලංකා විදුලිබල මණ්ඩල පනතේ 49(4) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

**------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට (ශ්‍රීලංගිප්‍ර/ ශ්‍රීලංමූවාප්‍ර) අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම අධ්‍යක්ෂ මණ්ඩලයේ ("අධ්‍යක්ෂ මණ්ඩලය") වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

**----------------------**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 - 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.
මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළ වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පටිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පටිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම් ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ.එම අවදානම් තක්සේරුකිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස ලංකා විදුලිබල මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ලංකා විදුලිබල මණ්ඩලයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

**--------------------------------------------**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2 මූල්‍ය ප්‍රකාශන
----------------

### 2.1 මතය
-------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, ලංකා විදුලිබල මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට එහි මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

### 2.2. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්
--------------------------------------

#### 2.2.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට (ශ්‍රී ලං ගි ප්‍ර/ ශ්‍රී ලං මූ වා ප්‍ර) අනුකූල නොවීම්
--------------------------------------------------------------------------------

පහත නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) **ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති I - මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**
ප්‍රමිතයේ ප්‍රතිපාදනවලට පටහැනිව රු.1,463,311,000 ක් වූ මුදල් හා මුදල්වලට සමාන දෑ වල හිතකර ශේෂයන් අහිතකර ශේෂවල එකතුව වූ රු.7,217,169,000 හිලව් කර (Set off) ශුද්ධ ශේෂය වූ රු.5,753,858,000 මුදල ජංගම වත්කම් යටතේ අහිතකර ශේෂයක් (negative figure) ලෙස දක්වා තිබුණි.

(ආ) **ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 2 - තොග හා ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 16 -දේපල, පිරියත හා උපකරණ**
ලංකා විදුලි බල මණ්ඩලය එහි ප්‍රාග්ධනිත හා නඩත්තු කාර්යයන් සඳහා දරන ලද ශ්‍රමය, ද්‍රව්‍ය හා පොදු කාර්ය පිරිවැය අගය කිරීම සඳහා ප්‍රමිතය අනුව තථ්‍ය පිරිවැය වෙනුවට ප්‍රමිත පිරිවැය යොදා ගනු ලැබේ. එහි ප්‍රතිඵලයක් ලෙස, එකතුව රු.5,918,929,637 ක් වූ හිතකර මිල විචලනය සහ ශ්‍රම හා පොදුකාර්ය රේට විචලනයන් සහ අහිතකර ගබඩා මිල විචලනය නිසා ඇති වූ රු.1,053,069,877 ක මුදල මූල්‍ය ප්‍රකාශනවල ගිණුම්ගත කර තිබුණි.
එහි ප්‍රතිඵලයක් ලෙස, ප්‍රාග්ධන කාර්යයන්ට අදාල ඉහළ මූල්‍ය සම්බන්ධය හේතුවෙන් ලංකා විදුලි බල මණ්ඩලයේ මෙහෙයුම් ප්‍රතිඵල, වත්කම්, වගකීම් හා ස්කන්ධය කෙරෙහි සැලකිය යුතු බලපෑමක් ඇති වී තිබුණි. කෙසේ වුවද, එම ප්‍රාග්ධන කාර්යයන්වලට අදාලව අවශ්‍ය තොරතුරු නොමැතිවීම හේතුවෙන් එයින් මූල්‍ය ප්‍රකාශනවලට වන බලපෑම විගණනයේදී නිශ්චය කළ නොහැකි විය.

(ඇ) **ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 8 - ගිණුම්කරණ ප්‍රතිපත්ති, ගිණුම්කරණ ඇස්තමේන්තු වෙන්කිරීම් හා දෝෂ**

(i) ලංකා විදුලිබල මණ්ඩලයේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ස්ථිර ප්‍රතිපත්තිමය තීරණයක් ගැනීමෙන් තොරව අතිරේක සාමාන්‍යාධිකාරී (උත්පාදන) විසින් දෙන ලද උපදෙස් පරිදි රු.31,604,054 ක් හා රු.1,618,736,079 ක් වටිනා අමතර කොටස් පිළිවෙලින් මෙහෙයුම් වියදම් හා ප්‍රාග්ධන වියදම් ලෙස මණ්ඩලය විසින් ගිණුම්ගත කර තිබුණි. එබැවින්, එවැනි වර්ගීකරණයක් සඳහා යොදාගත් පදනම පිළිබඳ සාධාරණත්වය විගණනයේදී පිළිගැනීමට නොහැකි විය. තවද, වර්ගීකරණය සඳහා යොදාගන්නා ලද පදනම මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.

(ii) ගිණුම්කරණ ප්‍රතිපත්තිවල දක්වා ඇති පරිදි, ලංකා විදුලිබල මණ්ඩලය අඛණ්ඩව තවදුරටත් භාවිතයට ගනු ලබන සම්පූර්ණයෙන් ක්ෂය කරන ලද ජංගම නොවන වත්කම්වල ඵලදායී ජීවිත කාලය සමාලෝචනය කර නොතිබුණි. උදාහරණයක් වශයෙන්, සම්පූර්ණයෙන් ක්ෂය කරන ලද පිරිවැය රු.23,932,093,328 ක් වූ බලාගාර හතරක් නැවත අගය කිරීමකින් තොරව තවදුරටත් භාවිතයට ගනිමින් පැවතුණි.

(ඇ) **ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 39 - මූල්‍ය උපකරණ හඳුනාගැනීම හා මිනුම්කරණය**
එකතුව රු.7,457,082,610 ක් වූ සේවක ණය ගැතියන් ප්‍රමිතයේ අවශ්‍යතාවය පරිදි සාධාරණ අගයට මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි.

### 2.2.2 ගිණුම්කරණ අඩුපාඩු
---------------------

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) ලංකා විදුලිබල මණ්ඩලයේ විශ්‍රාම වැටුප් අරමුදල හා සේවක භාරකාර අරමුදල මඟින් කරන ලද පිළිවෙලින් රු.403,717,966 ක්, රු.2,312,756,993 ක් වූ ආයෝජන හා රු.51,399,687 ක් වූ ඒ සඳහා පොලිය, එම මූල්‍ය උපකරණවල නොපැවැත්ම හේතුවෙන් අයකර ගැනීම සැකසහිතය. කෙසේ වුවද, සමාලෝචිත වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශනවල මේ සම්බන්ධයෙන් කිසිඳු ගැලපීමක් හෝ ප්‍රතිපාදනයක් කර නොතිබුණි.

(ආ) විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශයට අයත් මෝටර් වාහන 02 ක් ලංකා විදුලිබල මණ්ඩලයේ දේපල ලෙස ගිණුම්ගත කිරීමේ ප්‍රතිඵලයක් වශයෙන් 2017 දෙසැම්බර් 31 දිනට දේපල, පිරියත හා උපකරණ (PPF) හා ඒ මත පාඩුව පිළිවෙලින් රු.14,605,980 කින් හා රු.2,086,567 කින් වැඩියෙන් දක්වා තිබුණි.

(ඇ) 2017 දෙසැම්බර් 31 දිනට ලංවීම ගිණුම්වල දැක්වෙන බාහිර පාර්ශව වලට අයත්ව තිබූ පිරිවැය රු.810,516 ක් වූ මෝටර් වාහන 09 ක් වර්ෂ කිහිපයකට පෙර සිට අස්ථානගත වී තිබුණි. එසේ වුවද, අවශ්‍ය ගැලපීම් කිරීමකින් තොරව එම මෝටර් වාහන සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් ලංකා විදුලිබල මණ්ඩලයේ ගිණුම් පොත්වල පැවතුණි.

(ඈ) වටිනාකම රු.1,473,735,676 ක හර ශේෂයක් (තොග ඌනතාවය) හා රු.16,654,669 ක බැර ශේෂයක් (තොග අතිරික්තය) නිරවුල් කිරීමෙන් තොරව වර්ෂ 1 කට වැඩි කාලයක් නිරවුල් කිරීමකින් තොරව තොග ගැලපීම් ගිණුමේ පැවතුණි.

(ඉ) එකතුව රු.746,546,369 ක් වූ විදේශ භාණ්ඩ ඇණවුම්වලට අදාළව කොමිස්, නිශ්කාෂණ ගාස්තු ආදී වියදම්, අදාළ වියදම් හෝ වත්කම් ගිණුම්වලට අවශෝෂණය කිරීමෙන් තොරව 2013 වර්ෂයේ සිට ලක් විජය විදුලි බලාගාර මාර්ගස්ථ - තොග ගිණුමේ පැවතුණි.

(ඊ) අමාත්‍ය මණ්ඩල අංක 10/2434/423/034 දරන තීරණය අනුව, ලක්විජය බලාගාරය ඉදිකිරීම සඳහා ලබාගත් රු.159,184,187,965 ක ණය මුදල හා එයට අදාල පොලිය ලංකා විදුලි බල මණ්ඩලය විසින් මහා භාණ්ඩාගාරයට ගෙවිය යුතුය. කෙසේ වුවද, මහා භාණ්ඩාගාරයේ විදේශ සම්පත් දෙපාර්තමේන්තුව විසින් ණය ලබාදුන් බැංකුවට සමාලෝචිත වර්ෂයේ රු.3,398,152,185 ක්ද ඇතුළුව 2016 දෙසැම්බර් 31 දිනට එම ණය සඳහා වන පොලිය වශයෙන් රු.18,567,893,780 ක් ගෙවා තිබුණද, ලංකා විදුලි බල මණ්ඩලයට එම ගෙවීම් සිදුකර නොතිබූ අතර, ගිණුම්වල ඒ සම්බන්ධයෙන් වෙන් කිරීම් හෝ සිදුකර නොතිබුණි. එම නිසා, සමාලෝචිත වර්ෂය සඳහා අලාභය සහ රඳවාගත් ඉපැයීම් පිළිවෙලින් රු.3,398,152,185 ක් හා රු.18,567,893,780 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(එ) ලංකා විදුලි බල මණ්ඩලයේ සේවක අර්ථසාධක අරමුදල වෙනුවෙන් ලංචීම දරන ලද රු.35,220,599 ක මුදල ලැබිය යුතු ලෙස ගිණුම්ගත කිරීම වෙනුවට වියදමක් ලෙස ගිණුම්ගත කර තිබුණු අතර එමනිසා සමාලෝචිත වර්ෂය සඳහා පාඩුව ඊට සමාන මුදලකින් වැඩියෙන් දක්වා තිබුණි.

(ඒ) 2015 මාර්තු 19 දිනැති අංක 15/0228/613/012 දරන අමාත්‍ය මණ්ඩල තීරණය අනුව ලද රු.820,969,500 කට සමාන ඇ.එ.ජ.ඩොලර් 5,412,000 ක ණය මුදල හා ඒ සඳහා වූ රු.5,602,295 ක පොලී මුදල මූල්‍ය ප්‍රකාශනවලට ගෙන නොතිබුණි. එමනිසා සමාලෝචිත වර්ෂයේ වගකීම් හා අලාභය පිළිවෙලින් රු.820,969,500 කින් හා රු.5,602,295 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(ඔ) 2013 වර්ෂයට පෙර ලංකා විදුලි බල මණ්ඩලය සිදුකරන ලද විදුලි සෝපාන වායු සමීකරණ යන්ත්‍ර හා විදුලි ජනක යන්ත්‍ර සැපයීම, අළුත්වැඩියාව හා නඩත්තු කිරීම් වැනි කාර්යයන් ඉන්වොයිස් පදනම් කරගෙන ගිණුම්ගත කරනු වෙනුවට පිරිවැය මත ගිණුම්ගත කර තිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල ලැබිය යුතු හා රඳවාගත් ඉපැයීම් රු.66,987,761 කින් අඩුවෙන් දක්වා තිබුණි.

### 2.2.3 නොසැසඳු වෙනස්කම්

-----------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2017 දෙසැම්බර් 31 දිනට ලංකා විදුලිබල මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන රු.49,468,844,000 ක ලංකා ඛනිජ තෙල් සංස්ථාවට ගෙවිය යුතු ශේෂය හා ලංකා ඛනිජ තෙල් සංස්ථාවේ (CPC) මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන රු.50,255,066,432 ක් වූ ලැබිය යුතු අනුරූපී ශේෂය අතර රු.786,222,430 ක වෙනසක් නිරීක්ෂණය විය.

ලංකා විදුලිබල මණ්ඩලයේ සභාපති විසින් මේ සම්බන්ධයෙන් පහත පරිදි වාර්තා කර තිබුණි. "2013 සැප්තැම්බර් 30 දින භාණ්ඩාගාර ලේකම් විසින් සභාපතිත්වය දරන ලද රැස්වීමේදී ගන්නා ලද තීරණයට අනුව, නොගෙවූ ඉන්වොයිස් වටිනාකම (ණය කාලපරිච්ඡේදයෙන් බැහැරව) මත පොලී 2013 අප්‍රේල් 20 දින සිට බල පැවැත්වෙන පරිදි ගෙවීමට තීරණය කර තිබුණි. කෙසේ වුවද, රු.753,610,829 ක ප්‍රමාද පොලී ගෙවීම ලංකා විදුලිබල මණ්ඩලය විසින් 2013 අප්‍රේල් 20 දිනට පෙර ඉන්ධන මිලදී ගැනීම සඳහා අදාළ වේ. එබැවින්, මණ්ඩලය වගකිව යුතු නොවන බැවින් මෙම වෙනස සඳහා සැසඳීමක් සිදුකිරීම අවශ්‍ය නොවේ."

(ආ) 2017 දෙසැම්බර් 31 දිනට බිල් කිරීම් පද්ධතියේ දැක්වෙන 01,02,03 හා 04 බෙදාහැරීම් අංශවල තොග වෙළඳ ණයගැති ශේෂයන් සහ සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන අතර එකතුව රු.331,154,817 ක නොසැසඳු වෙනස්කම් බිල් පද්ධතියේ හා මූල්‍ය ප්‍රකාශනවල සමහර ශේෂ මගහැරීම නිසා නිරීක්ෂණය විය.

### 2.2.4 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

-----------------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2017 දෙසැම්බර් 31 දිනට රු.18,203,663,608 ක වෙළඳ ණයගැති ශේෂයෙන්, සාමාන්‍ය හා තොග සැපයුම් වලට අදාළව රු.3,826,334,673 ක්වූ ශේෂයක් වර්ෂයකට වැඩිකාලයක් හිඟ හිට පැවති අතර, ඉන් රු.1,929,746,044 ක් අයකර ගැනීමෙන් තොරව වර්ෂ 5 කට වැඩි කාලයක් හිඟ හිට පැවතුණි. තවද, රු.423,764,624 ක් 2012 සිට හඳුනාගත නොහැකිව පැවතුණි.

(ආ) ලංකා විදුලි (පෞද්ගලික)සමාගමෙන් ලැබිය යුතු රු.46,548,248 ක මුදලක් කිසිදු අයකර ගැනීම් ක්‍රියාමාර්ගයක් ගැනීමෙන් තොරව, වර්ෂ පහකට වැඩි කාලයක් හිඟ හිට පැවතුණි.

(ඇ) එකතුව රු.2,505,397,073 ක් වූ පහත දැක්වෙන වෙනත් ලැබිය යුතු ශේෂ 2017 දෙසැම්බර් 31 දිනට වර්ෂ පහකට වැඩි කාලයක් අයකර ගැනීමෙන් තොරව පැවතුණු අතර මේ සම්බන්ධයෙන් මාගේ පෙර විගණන වාර්තාවලින්ද අවධාරණය කර තිබුණි.

| ණයගැතියාගේ නම | මුදල<br>රු. | විස්තරය |
|---|---|---|
| මහා භාණ්ඩාගාරය | 225,000,000 | අයකරගත යුතු මාර්ග ආලෝක කරණය හා නඩත්තු කිරීමේ පිරිවැය |
| සීමාසහිත වුඩ් ශෘප් ගෑස් ටර්බයින් | 8,264,352 | වෙස්ට් කෝස්ට් විදුලිබල පිරියත සඳහා ප්‍රවේශ මාර්ගයක් ඉදිකිරීම සඳහා කරන ලද ගෙවීම්. |
| විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශය | 6,142,277 | කෙරවලපිටිය ඒකාබද්ධ විදුලිබල පිරියත විවෘත කිරීමේ උත්සවය සඳහා ගෙවීම්. |
| ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය | 897,025,999 | කුඩා විදුලිබල සංවර්ධකයින්ට ලංකා විදුලිබල මණ්ඩලය විසින් ගාස්තු ගැලපීම, ගෙවීම. |
| සීමාසහිත ඒර්එස් කැළණිතිස්ස (පුද්ගලික) සමාගම | 1,368,964,445 | මිල වෙනස්කම් පිළිබඳ ගෙවීම් මත අයකරගත යුතු මුදල |
| එකතුව | 2,505,397,073 | |

(ඇ) 2016 වර්ෂයේ මහා භාණ්ඩාගාරය විසින් අයකරන ලද රු.බිලියන 05 ක විශේෂ බදු වෙනුවෙන් නිකුත් කිරීමට එකඟ වූ භාණ්ඩාගාර බිල්පත් අගය 2017 වර්ෂය අවසාන වන විටද මණ්ඩලයට ලැබී නොතිබුණු අතර එය මූල්‍ය ප්‍රකාශනවල අනෙකුත් ණයගැතියෝ වශයෙන් පෙන්වා තිබුණි.

### 2.2.5 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

විගණනයේදී පහත සඳහන් අනුකූල නොවීම් අවස්ථා නිරීක්ෂණය විය.

**(අ) 1969 අංක 17 දරන ලංකා විදුලි බල මණ්ඩල පනත**

(i) **47(1)(ආ) වගන්තිය -** ලංකා විදුලිබල මණ්ඩලය විසින් ලබාගන්නා ලද ණය ආපසු ගෙවීමට අදාළව ලංකා විදුලිබල මණ්ඩලය විසින් මහා භාණ්ඩාගාරය සමඟ නිදන් අරමුදලක් ස්ථාපිත කර පවත්වා ගත යුතුය. මෙම අරමුදලේ ශේෂයක් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණද, එය 2000 වර්ෂයේ සිට යාවත්කාලීන කර නොතිබුණි. 2017 දෙසැම්බර් 31 දිනට එම සංචිත ගිණුමේ ශේෂය රු.මිලියන 17,447 ක් විය.

(ii) **47(2)(අ) වගන්තිය -** ලංකා විදුලිබල මණ්ඩලයේ චංචල හා නිශ්චල දේපලවල ක්ෂය ආවරණය කර ගැනීම සඳහා මණ්ඩලය විසින් මහා භාණ්ඩාගාරය සමඟ ක්ෂය සංචිතයක් ස්ථාපිත කර පවත්වා ගත යුතුය. කෙසේ වුවද එම අවශ්‍යතාවයට පටහැනිව, 2000 දෙසැම්බර් 31 දක්වා වාර්ෂිකව රු.මිලියන 1 ක් මාරු කිරීම මඟින් මණ්ඩලය විසින් එහි මූල්‍ය ප්‍රකාශනවල ක්ෂය සංචිතයක් ඇති කර තිබූ අතර, ඉන්පසු කිසිදු සංචලනයක් සිදු කර නොතිබුණි. එදිනට සමුච්චිතව පැවති රු.මිලියන 23 ක මුදලක් කිසිදු සමාලෝචනයකින් තොරව මූල්‍ය ප්‍රකාශනවල අඛණ්ඩව ඉදිරියට ගෙනැවිත් තිබුණි.

(iii) **47 (2) (ආ) වගන්තිය -** ලංකා විදුලිබල මණ්ඩලයේ මූල්‍ය ස්ථාවරත්වය තහවුරු කර ගැනීම සඳහා හා මණ්ඩලය විසින් වරින්වර තීරණය කරනු ලබන වෙනත් එවැනි අරමුණු සඳහා මණ්ඩලයේ ආදායමෙන් ප්‍රාග්ධන වැඩ සඳහා මූල්‍යයනය කිරීමේ අරමුණින් මණ්ඩලය විසින් මහා භාණ්ඩාගාරය සමඟ එක්ව පොදු සංචිතයක් ස්ථාපිත කර පවත්වා ගත යුතුය. කෙසේ වුවද එම අවශ්‍යතාවයට පටහැනිව ලංකා විදුලිබල මණ්ඩලය විසින් එහි මූල්‍ය ප්‍රකාශනවල වෙනත් ප්‍රාග්ධන සංචිතයක් ස්ථාපිත කර තිබූ නමුත් 2000 වර්ෂයේ සිට එය යාවත්කාලීන කර නොතිබුණි. 2017 දෙසැම්බර් 31 දිනට එම සංචිත ගිණුමේ ශේෂය රු.මිලියන 165.45 ක් විය.

(iv) **46 වගන්තිය සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 11 කොටසේ II (අ) සහ (ආ) වගන්ති -** මණ්ඩලය විසින් 1989 වර්ෂයේ සිට එක් එක් වර්ෂය අවසානයේදී දළ ස්ථාවර වත්කම් මුළු වටිනාකමින් සියයට 0.1 ක දායකයක් ආයෝජනය කළ යුතු වුවද 2017 දෙසැම්බර් 31 දිනට රු.මිලියන 7,246 ක් වූ එහි අරමුදල් ඉන්ෂුවරන්ස් එස්ක්‍රෝ අරමුදලේ ආයෝජනය කර තිබුණි.

(ආ) 2009 අංක 20 දරන ශ්‍රී ලංකා විදුලිබල පනතේ 28 (3) වගන්තියේ දක්වා ඇති පරිදි ලංකා විදුලිබල මණ්ඩලය විසින් පාරිභෝගික තැන්පතු සඳහා පොලිය ගෙවා නොතිබුණු අතර 2017 වර්ෂය සඳහා ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව විසින් වාර්තා කරන ලද රේටය පදනම්ව විගණනය විසින් කරන ලද ගණනය කිරීම් අනුව ඒ සඳහා පොලිය රු.මිලියන 1,163 ක් වූ අතර 2017 දෙසැම්බර් 31 දිනට සමුච්චිත නොගෙවූ පොළිය රු.මිලියන 1,963 ක් විය.

(ඇ) 2017 දෙසැම්බර් 31 දිනට රක්ෂණ සංචිත අරමුදලට අදාළව රු.මිලියන 7,088 ක මුදලක් ලංකා විදුලිබල මණ්ඩලයේ ස්වයං රක්ෂණ ප්‍රතිපත්තිය අනුව ආයෝජනය කර නොතිබුණි. තවද, එවැනි ව්‍යවස්ථාපිත අවශ්‍යතාවයන් ක්‍රියාත්මක කිරීම සඳහා ලංකා විදුලිබල මණ්ඩලයේ විධිමත් මූල්‍ය කළමනාකරණයක් ක්‍රියාත්මක නොවීය.

**3. මූල්‍ය සමාලෝචනය**

---------------------

**3.1 මූල්‍ය ප්‍රතිඵල**

-------------

විගණනය සඳහා ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂය තුළදී ලංකා විදුලිබල මණ්ඩලයේ මෙහෙයුම්වලින් වූ ප්‍රතිඵලය රු.මිලියන 45,729 ක බදු පූර්ව ශුද්ධ පාඩුවක් වූ අතර එයට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ බදු පූර්ව ශුද්ධ පාඩුව රු.මිලියන 13,191 ක් වූයෙන් සමාලෝචිත වර්ෂය සඳහා මූල්‍ය ප්‍රතිඵලයේ රු.මිලියන 32,538 පිරිහීමක් දැක්වුණි. මිල වැඩිවීම නිසා ගල් අඟුරු පිරිවැය සියයට 86 කින් වැඩිවීම හා ගල්අඟුරු ආනයනය මත එකතු කිරීමේ බදු (VAT) පැනවීම මූල්‍ය ප්‍රතිඵලවල මෙම පිරිහීම සඳහා ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

කෙසේ වුවද, එකතුව රු.මිලියන 63,741 ක් වූ පෞද්ගලික පඩිනඩි, බදු වියදම හා ක්ෂය සැලකිල්ලට ගැනීමෙන් පසු සමාලෝචිත වර්ෂය සඳහා ලංවීම අගය එකතු කිරීම රු.මිලියන 26,210 ක් වූ අතර එය පෙර වර්ෂයට සාපේක්ෂව රු.මිලියන 21,243 කින් හෙවත් සියයට 44 කින් අඩු වී තිබුණි.

## 3.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

### 3.2.1 කාරක ප්‍රාග්ධන කළමනාකරණය

2017 දෙසැම්බර් 31 දිනට ලංවීම කාරක ප්‍රාග්ධනය රු.මිලියන 49,189 ක අහිතකර ශේෂයක් වූ අතර එය පෙර වර්ෂයේ රු. මිලියන 3,575 ක අහිතකර ශේෂයක් වූ බැවින් පෙර වර්ෂයට සාපේක්ෂව කාරක ප්‍රාග්ධන තත්ත්වය සියයට 1276 කින් පිරිහී තිබුණි. රු.මිලියන 37,004 කින් ලංකා ඛණිජ තෙල් සංස්ථාවට ගෙවිය යුතු මුදල ඉහළ යාම මෙම පිරිහීමට ප්‍රධාන හේතුව වී තිබුණි. තවද, ලංවීම සමාලෝචිත වර්ෂය තුළදී බැංකු අයිරා පොලී වශයෙන් රු.මිලියන 846 ගෙවීම් කර තිබූ අතර පසුගිය වර්ෂය හා සැසඳීමේදී එය සියයට 3,560 ක වැඩිවීමක් පෙන්නුම් කරයි.

### 3.2.2 ස්කන්ධයට ණය

අඛණ්ඩ ශුද්ධ පාඩුව හේතුවෙන් ලංවීමේ ස්කන්ධය සියයට 11 කින් පෙර වර්ෂයට සාපේක්ෂව අඩු වී තිබූ අතර එය පෙර වර්ෂයට වඩා සියයට 04 ක අඩුවීමකි. එහි ප්‍රතිඵලයක් ලෙස පෙර වර්ෂයේ සියයට 53 සිට සමාලෝචිත වර්ෂයේ සියයට 62 දක්වා ලංවීම ස්කන්ධයට ණය අනුපාතය වැඩි වී තිබුණි. තවද, 2017 දෙසැම්බර් 31 දිනට ලංවීම විසින් යෙදවූ මුළු ප්‍රාග්ධනයෙන් සියයට 33 ක් හෙවත් රු.බිලියන 229 ක් ණය ගැනීම් මගින් මූල්‍යයනය කර තිබුණි.

### 3.2.3 ලාභදායීත්වය

2016 වර්ෂයේ සාමාන්‍ය ඒකක පිරිවැය වූ රු.18.08 ට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ සාමාන්‍ය ඒකක පිරිවැය රු.20.34 ක් වූ අතර එක් ඒකකයක් රු.16.26 ක සාමාන්‍ය මිලකට විකුණා තිබුණි. (පෙර වර්ෂයේ සාමාන්‍ය විකුණුම් මිල ඒකකයකට රු.16.18 ක් විය.) ඒ අනුව සමාලෝචිත වර්ෂයේ එක් ඒකකයකින් දළ පාඩුව රු.4.08 ක් වූ අතර පෙර වර්ෂයේ එක් ඒකකයකට රු.1.90 ක් වූ සාමාන්‍ය දළ පාඩුවට සාපේක්ෂව එය සියයට 114 ක වැඩිවීමක් විය. ගාස්තු වර්ගය හා පෙර වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ විකුණූ විදුලිබල එක් ඒකකයකට දායකය (Kwh) පහත වගුවෙන් දැක්වේ.

| වර්ගය | එක් ඒකකයකට දායකය (Kwh) | |
|---|---|---|
| | **2017** | **2016** |
| | රු. | රු. |
| ගෘහස්ථ | (6.86) | (4.66) |
| ආගමික ස්ථාන | (13.13) | (10.93) |
| සාමාන්‍ය කාර්යය | 3.40 | 5.82 |
| හෝටල් | (2.61) | (0.34) |
| කර්මාන්ත | (5.57) | (3.45) |
| රජය | (2.08) | 0.26 |
| ලංකා විදුලි (පුද්ගලික) සමාගමට තොග විකුණුම් | (4.55) | (2.31) |
| වීථි ආලෝකකරණය | (20.34) | (18.08) |
| ඒකකයකට දායකය | (4.08) | (1.90) |

ඒ අනුව, සාමාන්‍ය කාර්යය ගාස්තු වර්ගය පමණක් සමාලෝචිත වර්ෂය සඳහා මුළු දායකයට ධනාත්මක දායකයන් විය. පෙර වර්ෂයේ රජයේ ගාස්තු වර්ගය ධනාත්මක වුවද, මෙම වර්ෂයේ සෘණාත්මක වී ඇත. සමාලෝචිත වර්ෂයේ මුළු දායකයට වැඩිම සෘණාත්මක දායකය වූයේ කර්මාන්ත හා ගෘහස්ථ වර්ගය මත ගාස්තු වර්ගයයි. එසේම ආගමික, රජය, හෝටල්, ලංකා විදුලි සමාගම සඳහා විකුණුම් හා මාර්ග අලෙවිකරණය යන ගාස්තු වර්ගද ඒ සඳහා අහිතකර දායකයන් දක්වා තිබුණි.

## 4 මෙහෙයුම් සමාලෝචනය

## 4.1 කාර්යසාධනය

### 4.1.1 විදුලි බල උත්පාදනය හා උත්පාදන පිරිවැය (බෙදාහැරීම් හා සම්ප්‍රේෂණ පිරිවැය රහිතව)

පහත නිරීක්ෂණ කරනු ලැබේ.

(i) ලංකා විදුලි බල මණ්ඩලයේ ප්‍රධාන අරමුණු රටට අවශ්‍ය විදුලි බලය අඩු පිරිවැයකට සැපයීම වුවද, විදුලි බල මිලදීගැනීම් ගිවිසුම්වල පවතින අහිතකර කොන්දේසි, තාප විදුලිය නිෂ්පාදනය සඳහා අධික වියදමක් දැරීම සහ සුළං හා අනෙකුත් සාම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්ති ප්‍රභවයන්ගේ අඩු දායකත්වය ආදිය නිසා ලංවීමට මෙම අරමුණු ලඟාකර ගැනීමට නොහැකි වී තිබුණි. තවද, ලංකා විදුලි බල මණ්ඩලයේ දිගුකාලීන උත්පාදක සැලස්ම සහ සම්ප්‍රේෂණ සැලස්ම ක්‍රියාත්මක කිරීමේ කටයුතුවල සැලකිය යුතු ප්‍රමාදයන් දක්නට ලැබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස, ලංවීම හදිසි විදුලි බල මිලදී ගැනීම් කර තිබූ අතර (රු.මිලියන 26,628 ක් පිරිවැය වූ 1,240 Gwh) එය ලංවීම අඩු පිරිවැය අරමුණු සඳහා අහිතකර ලෙස බලපා තිබුණි.

2017 වර්ෂය තුළ විදුලිබල උත්පාදනය ඉකුත් වර්ෂය සමඟ සසඳා පහත දැක්වේ.

| ප්‍රභවය | | | සමස්ත උත්පාදනයට දායකත්වය ප්‍රතිශතයක් ලෙස | |
|---|---|---|---|---|
| | 2017 | 2016 | 2017 | 2016 |
| | ගිවොපැ | ගිවොපැ | | |
| ජලවිදුලි | 4,004 | 4,220 | 27 | 30 |
| තාප | 5,045 | 4,461 | 34 | 31 |
| ගල් අඟුරු | 5,103 | 5,047 | 35 | 36 |
| සුළං | 367 | 345 | 3 | 2 |
| සාම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්ති | 152 | 76 | 1 | 1 |
| එකතුව | 14,671 | 14,149 | 100 | 100 |

(ii) ව්‍යාපෘති ප්‍රමාදවීම

සම්ප්‍රේෂණ මාර්ග සහ ජාල වැඩිදියුණු කිරීම් ව්‍යාපෘතිය හා විදුලි බල උත්පාදන ව්‍යාපෘති තුනක නිමකිරීමේ කාල සීමාව දීර්ඝකර තිබුණද, මෙම ව්‍යාපෘති මේ දක්වා නිමකර නොතිබුණි.

(iii) සෘජු පිරිවැය

----------------

මෙම වර්ෂයේ ගල් අඟුරු විදුලි උත්පාදනයේ සැලකිය යුතු වැඩිවීමක් නොතිබුණද, පෙර වර්ෂය හා සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ ගල් අඟුරු විදුලි උත්පාදන පිරිවැය රු.මිලියන 17,301 කින් සැලකිය යුතු ලෙස වැඩි වී ඇති බව අනාවරණය විය. තවද, පෙර වර්ෂය හා සැසඳීමේදී විදුලි බලය මිලදී ගැනීමේ පිරිවැය සහ ඉන්ධන වියදම පිළිවෙලින් රු.මිලියන 7,502 කින් හා රු.මිලියන 7,768 ක් හෙවත් සියයට 09 කින් හා සියයට 15 කින් වැඩිවීමක් පෙන්නුම් කරන අතර, සමාලෝචිත වර්ෂයේ තාප බල විදුලි උත්පාදනය වැඩි වී තිබෙනුයේ සියයට 13 කින් පමණි.

විදුලි බල උත්පාදනයේ ඇතුළත් සෘජු වියදම් පිළිබඳ විස්තර පහත දැක්වේ.

| **විස්තරය** | **2017** | | **2016** | |
|---|---|---|---|---|
| | රු. මිලියන | ප්‍රතිශතය | රු.මිලියන | ප්‍රතිශතය |
| ඉන්ධන | 57,842 | 27 | 50,074 | 28 |
| **විදුලිබල මිලදී ගැනුම්** | 89,254 | 42 | 81,752 | 46 |
| ගල්අඟුරු | 37,505 | 18 | 20,204 | 11 |
| මෙහෙයුම් හා නඩත්තුව | 11,727 | 6 | 12,083 | 7 |
| **ක්ෂය** | 14,476 | 7 | 14,797 | 8 |
| මුළු සෘජු පිරිවැය | 210,804 | 100 | 178,910 | 100 |

## 4.2 කළමනාකරණ කාර්යයන්

------------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ප්‍රසම්පාදන ක්‍රියාවලියේදී හඳුනාගත හැකිවූ ඔරොත්තු නොදෙන ඌන පරිපථ තත්ත්වයන්ට හේතුවෙන් 2005 වර්ෂයේදී රු.18,254,550 කට මිලදී ගෙන තිබූ වර්ෂ 35 ක ප්‍රයෝජනවත් ආර්ථික ජීව කාලයක් සහිත ට්‍රාන්ස්ෆෝමර් 2 ක් වර්ෂ 5-7 ඇතුළත භාවිතයෙන් ඉවත් කර තිබුණි. මේවා විකුණා ඉවත් කිරීමට අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබා තිබුණි. කෙසේ වුවද, මේ සම්බන්ධයෙන් වගකිව යුතු පුද්ගලයන් හඳුනාගැනීම සඳහා විමර්ශනයක් සිදුකිරීම සඳහා කිසිඳු පියවරයක් ගෙන නොතිබුණි.

(ආ) 2014 සැප්තැම්බර් 11 දින රු.7,221,707 ක පිරිවැයකට ප්‍රසම්පාදනය කරන ලද ඉන්සියුලේටර් (Pin 33 KV) 3000 ක තත්ත්වය පිළිබඳ ගැටලු හේතුවෙන් භාවිතා කර නොතිබූ අතර ඒවා ආදේශ කිරීමෙන් තොරව 2018 සැප්තැම්බර් 30 වන විටත් ගබඩාවේ නිෂ්කාර්යව පැවතුණි. මේ සම්බන්ධයෙන් ලබාගත් කාර්යසාධන බැඳුම්කරයේ වලංගු කාලය 2016 පෙබරවාරි 26 දින ඉකුත් වී ඇති බවද තවදුරටත් නිරීක්ෂණය විය.

(ඇ) උතුරු වසන්තය ව්‍යාපෘතිය යටතේ 2014 වර්ෂයේදී හඳුනාගන්නා ලද රු.52,550,929 ක තොග ඌනතාවය සම්බන්ධයෙන් අභ්‍යන්තර විගණන ශාඛාව විසින් විශේෂ විමර්ශනයක් 2017 අප්‍රේල් මාසයේදී සිදුකර තිබුණි. කෙසේ වුවද, 2018 සැප්තැම්බර් 30 වන විටත් මෙම ඌනතාවය සඳහා වගකිව යුතු නිලධාරීන්ට එරෙහිව කිසිඳු පියවරක් ගෙන නොතිබුණි. මේ සම්බන්ධයෙන් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් 2015 වර්ෂයේදී ත්‍රිකුණාමලය, මහේස්ත්‍රාත් අධිකරණයේ නඩුවක් (නඩු අංකය B/1164/15) ගොනු කර තිබුණි. කෙසේ වුවද, එම අධිකරණ නඩුව පිළිබඳ වර්තමාන තත්ත්වයට අදාළ තොරතුරු විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

(ඇ) වත්කම් කළමනාකරණ අංශයේ (පවර් ප්ලාන්ට්) 2006 නොවැම්බර් 20 දින සිට 2012 පෙබරවාරි 20 දක්වා කාලසීමාව තුල සිදුවී තිබූ රු.3,674,861 තොග ඌනතාවය පිළිබඳ විධිමත් විමර්ශන අවසන් වී තිබුණද, වගකිව යුතු පුද්ගලයාට එරෙහිව අධ්‍යක්ෂ මණ්ඩලය 2018 අගෝස්තු 16 දින වන විටත් ක්ෂණික පියවර ගෙන නොතිබුණි. තවද, මෙම පුද්ගලයා වෙනත් කාර්යාලයක සිදුවූ වංචාවක් පිළිබඳ වරදකරු වී එහි පාඩුවේ වටිනාකම වූ රු.99,155 ක් අයකරගෙන සේවයෙන් ඉවත් කර තිබුණි.

(ඉ) වටිනාකම රු.3,789,893 ක්වූ තොග ඌනතාවය සම්බන්ධයෙන් විමර්ශනය කිරීම සඳහා පත්කළ කමිටුවේ නිර්දේශය පරිදි පාඩුව අයකර ගැනීමකින් තොරව 2011 ඔක්තෝබර් 15 දින සිට එම වගකිව යුතු නිලධාරියාට විශ්‍රාමයාමට අවසරය ලබාදී තිබුණි. තවද, ඉහත ද්‍රව්‍ය සම්බන්ධයෙන් කිසිදු පිළියමක් යෙදීමකින් තොරව ගිණුම් පොත්වල රඳවා තිබුණි.

(ඊ) වටිනාකම රු.4,860,885 ක් වූ ආපදා ණය, ප්‍රවාහන ණය, උත්සව අත්තිකාරම් හා විශේෂ අත්තිකාරම් ආදී සේවක ණය කිසිඳු අයකිරීම් ක්‍රියාමාර්ගයක් ගැනීමකින් තොරව වර්ෂ 5 කට වැඩි කාලයක් හිඟ හිට පැවතුණි.

### 4.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

වටිනාකම රු.17,936,845,512 ක් වූ මුළු පාරිභෝජන තොගවල ඇතුලත් සියයට 11 ක් වූ එනම් රු.2,051,605,881 ක් වටිනා සෙමින් චලනය වන, චලනය නොවන සහ හානි වූ තොග 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල දක්නට ලැබුණි. මෙපමණ චලනය නොවන සහ සෙමින් චලනය වන තොග පවත්වා ගැනීමෙන් තොග හානිවීම්, රඳවා තබා ගැනීමේ පිරිවැය හා වංචා වැනි දෑ වැඩිවීමට හේතු විය හැකිය.

### 4.4 අවිධිමත් ගනුදෙනු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2007 දෙසැම්බර් 13 දින අධ්‍යක්ෂ මණ්ඩල තීරණය මත වැටුප් සංශෝධන අවස්ථාවේදී හා 2015 මැයි 20 දින සාමූහික ගිවිසුම සලකා බලන අවස්ථාවේදී උපයන විට ගෙවීම් බදු (PAYE) බැරකම සේවකයන්ට මාරු කිරීමට තීරණය කර තිබුණි. කෙසේ වුවද අමාත්‍ය මණ්ඩලය විසින් ගනු ලැබූ ඉහත තීරණයන්ට පටහැනිව අදාළ සේවකයන්ගේ වැටුප්වලින් අයකර ගැනීමෙන් තොරව 2010 සිට 2017 කාලපරිච්ඡේදය තුළ රු.3,294,348,130 ක් වූ උපයන විට ගෙවීම් බදු ලංකා විදුලිබල මණ්ඩලය විසින් එහි අරමුදල්වලින් ගෙවා තිබුණි. සමාලෝචිත වර්ෂය තුළ ගෙවන ලද රු.676,508,227 ක් වූ උපයන විට ගෙවීම් (PAYE) බදු මුදල ලංකා විදුලිබල මණ්ඩලයේ වියදමක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

එක් එක් සේවකයාගේ උපයන විට ගෙවීම් බදු ගණනය කිරීමේදී 2001 මැයි 20 දිනැති අංක 1706/18 දරන ගැසට් නිවේදනය ප්‍රකාරව දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් විසින් දක්වා තිබූ මුදල් නොවන ප්‍රතිලාභ වටිනාකම් සැලකිල්ලට ගත යුතුය. කෙසේ වුවද, නිල නිවාස, මහල් නිවාස හා පුද්ගලික භාවිතය සඳහා මෝටර් වාහන සැපයීම ආදිය වැනි මුදල් නොවන ප්‍රතිලාභ මණ්ඩලය විසින් සැලකිල්ලට ගෙන නොතිබුණි.

(ආ) 2007 නොවැම්බර් 14 දින අමාත්‍ය මණ්ඩලය විසින් ගන්නා ලද තීරණයට හා 2009 මැයි 26 දිනැති අංක 39 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයට පටහැනිව, අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය මත මණ්ඩලය විසින් එහි සේවකයන්ට විවිධ සේවක දීමනා වරින් වර ගෙවා තිබුණි. 2017 වර්ෂයේදී හා 2016 වර්ෂයේදී පිළිවෙලින් රු.මිලියන 1,930 ක් හා රු.මිලියන 1,222 ක එවැනි දීමනා ගෙවා තිබූ බව විගණන නියැදි පරීක්ෂණවලදී අනාවරණය විය.

(ඇ) 1998 මාර්තු 08 දිනැති අංක 130 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය ප්‍රකාරව, සියයට 10 සිට සියයට 14 දක්වා වූ පොලී අනුපාතයකට වාහන ණය ලබාදීම වෙනුවට, මණ්ඩලය විසින් සියයට 4.2 ක පොලී අනුපාතයකට මෙම වාහන ණය ලබා දී තිබුණි. තවද, ලංකා විදුලිබල මණ්ඩලය බරපතළ ද්‍රවශීලතා ගැටලුවලට මුහුණ දී තිබුණද, කිසිඳු පාලනයකින් තොරව සේවක ණය ලබා දී තිබූ බව නිරීක්ෂණය විය.

## 4.5 මතභේදයට තුඩුදෙන කරුණු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ලංකා විදුලිබල මණ්ඩලය විසින් වර්ෂ ගණනාවක් ලංකා විදුලි (පෞද්ගලික) සමාගමට විදුලි බලය විකිණීම හා ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාවෙන් ඉන්ධන මිලදී ගැනීම සිදුකර තිබුණද, එක් එක් ආයතනයේ සුමට මෙහෙයුම් ක්‍රියාත්මක කිරීම සඳහා එම දෙපාර්ශවයන් සමඟ විකුණුම් හා ගැණුම් ගිවිසුම්වලට එළඹ නොතිබුණි.

(ආ) උපණය ගිවිසුම් අනුව ලංකා විදුලිබල මණ්ඩලය විසින් රු.2,171,027,353 ක් වූ පොලී මහා භාණ්ඩාගාරයට ගෙවීම් කර නොතිබූ අතර, ඉහත පොලී ගෙවීම් කිරීම පමාවීම මත වාර්ෂිකව සියයට 01 සිට සියයට 02 දක්වා අතිරේක පොලියක් ගෙවීමට සිදුවී තිබුණි. තවද, එකතුව රු.13,090,107,000 කට අදාල උපණය ගිවිසුම් 04 ක් විගණනය සඳහා ඉදිරිපත් නොකෙරුණි.

## 4.6 හඳුනාගත් පාඩු

කාලීන ආකාරයෙන් අරමුදල් උපයෝජනය නොකිරීම හේතුවෙන් ලංකා විදුලිබල මණ්ඩලයේ විදේශීය මූල්‍යයන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා ලබා දී තිබූ ණය මුදල් වලින් 2017 වර්ෂයේදී බැඳීම් ගාස්තු ලෙස රු.41,829,697 ක මුදලක් ණය නියෝජිතායතනය විසින් අඩුකරගෙන තිබුණි.

## 4.7 මානව සම්පත් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ලංකා විදුලිබල මණ්ඩලයේ බඳවාගැනීම් හා උසස්වීම් පරිපාටිය (SOR) දීර්ඝ කාලයක් තුළදී යාවත්කාලීන කර නොතිබුණි.

(ආ) මානව සම්පත් අංශයේ ප්‍රධාන තනතුර නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (පිරිස්) වන නමුත්, එම තනතුර සඳහා අවශ්‍ය සුදුසුකම් හා පළපුරුද්ද බඳවා ගැනීම් හා උසස්වීම් පරිපාටියේ (SOR) දක්වා නොතිබුණු අතර එම තනතුර වෙනත් සේවාවලට විශේෂයෙන් විදුලි ඉංජිනේරුවරුන් සඳහා විවෘත කර තිබුණි.

(ඇ) පවත්නා බඳවා ගැනීම් පරිපාටියට අනුව, මානව සම්පත් නිලධාරීන්ගේ (HRO) මුළු සේවක සංඛ්‍යාවෙන් සියයට 50 ක් බාහිරව පුරවන අතර එම ප්‍රතිශතය වර්ෂයෙන් වර්ෂයට සියයට 85 ක් දක්වා ක්‍රම ක්‍රමයෙන් වැඩිකිරීමට සැලසුම් කර තිබුණි. කෙසේ වුවද, ලංකා විදුලිබල මණ්ඩල ඉතිහාසයේ දීර්ඝම කාලයක් ඉංජිනේරුවන් දෙදෙනෙකු විසින් අංශ ප්‍රධානී කාර්යයන් ආවරණය කරන බැවින් මෙසේ බාහිරව බඳවා ගන්නා සේවකයන්ට උසස්වීම් පරිපාටියේ පැහැදිලි උසස්වීම් මාර්ගයක් ඇති බව නිරීක්ෂණය නොවීය.

(ඈ) මානව සම්පත් කළමනාකරු (HRM) හා මානව සම්පත් නිලධාරී (HRO) සෘජුවම බඳවා ගැනීම සඳහා සේවකයන් 100 කට වැඩි ප්‍රමාණයක් සිටින ආයතනයක මානව සම්පත් ක්ෂේත්‍රයේ අවශ්‍යවන වර්ෂ 06 ක පළපුරුද්ද ලංකා විදුලිබල මණ්ඩලයේ කටයුතු කරන මුළු සේවක සංඛ්‍යාව සමඟ සැසඳීමේදී ප්‍රමාණවත් නොවීය.

## 5. තිරසාර සංවර්ධන අරමුණු ලඟාකර ගැනීම

එක්සත් ජාතීන් විසින් හඳුන්වා දුන් "තිරසාර සංවර්ධනය පිළිබඳ 2030 න්‍යාය පත්‍රයේ" අරමුණු 17 අතරින් 7 වන අරමුණු වනුයේ දැරිය හැකි විශ්වාසනීය, තිරසාර හා නවීන බලශක්ති සේවාවක් සඳහා ප්‍රවේශ වීම සහතික වීම වන අතර, එම අරමුණු ලංකා විදුලිබල මණ්ඩලය විෂය පථයට අයත් වේ. එනිසා ලංකා විදුලිබල මණ්ඩලය ශ්‍රී ලංකාව තුල මෙම අරමුණු 2030 වන විට ලඟාකර ගැනීම සහතික වීමට වගකිව යුතු වේ. කෙසේ වුවද, ලංකා විදුලිබල මණ්ඩලය මේ දක්වා මෙම අරමුණු ලඟාකර ගැනීම සඳහා අවශ්‍ය වන ඉලක්ක හා සන්ධිස්ථාපනයන් හඳුනාගෙන නොතිබුණි.

## 6. ගිණුම්කටයුතුභාවය හා යහපාලනය

### 6.1 සමාජ වගකීම්

ලක්විජය විදුලි බලාගාරය සඳහා පළාත් පාරිසරික ආරක්ෂණ අධිකාරිය විසින් 2017 ජුලි මාසයේ සිට පාරිසරික ආරක්ෂණ බලපත්‍රය (EPL) නිකුත් කර නොතිබුණි.

### 6.2 නොවිසඳුනු විගණන ඡේද

සමාලෝචිත වර්ෂය අවසාන වන විටද පෙර වර්ෂයේ විගණන වාර්තා මගින් මතුකළ විගණන ඡේද තිස් දෙකක් සම්බන්ධයෙන් විසඳුම් ලබා නොදී ඉදිරියට ගෙනවිත් තිබුණි.

## 7. පද්ධති හා පාලන

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු මණ්ඩලයේ අවධානයට වරින් වර යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතු වේ.

| | පද්ධති හා පාලන ක්ෂේත්‍ර | | නිරීක්ෂණ |
|---|---|---|---|
| (අ) | වත්කම් කළමනාකරණය | i | බෙදාහැරීම් අංශවල ප්‍රාග්ධන වැඩ නිමකිරීම් පිළිබඳ දිගු ප්‍රමාදයන් තිබීම. |
| | | ii | දිවයින පුරා පැතිරුණු ලංකා විදුලිබල මණ්ඩලයට අයත් ඉඩම් මැනීම, අගය කිරීම් හා ආරක්ෂා කිරීම් කඩිනම් කිරීම. |
| | | iii | මෝටර් වාහන සඳහා යාවත්කාලීන කරන ලද දත්ත පදනමක් පවත්වා ගැනීම. |
| (ආ) | ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම් | | ණයගැතියන් හා වෙනත් ලැබිය යුතු ශේෂ කාලීනව අයකර ගැනීම. |
| (ඇ) | මානව සම්පත් කළමනාකරණය | | ආයතනයේ අරමුණු සාක්ෂාත් කරගැනීම සඳහා කාර්යභාරය හා ප්‍රමාණය අනුව මානව සම්පත් කළමනාකරණය. |
| (ඈ) | ඉන්වෙන්ට්‍රි පාලනය | i | තොග වාර්තා විධිමත්ව පවත්වා ගැනීම. |
| | | ii | තොග ඌනතාවය වළක්වා ගැනීම සඳහා ගල් අඟුරු තොග මෙහෙයුම් පිළිබඳ අදාළ පාලනයන් ස්ථාපිත කිරීම හා පවත්වා ගැනීම. |

| | | | |
|---|---|---|---|
| (ඉ) | ව්‍යාපෘති කළමනාකරණය හා පාලනය | i | නියමිත කාලවකවානු තුල ව්‍යාපෘති කාර්යයන් අවසන් කිරීම. |
| | | ii | ඉංජිනේරු ඇස්තමේන්තු තාත්විකව පිළියෙල කිරීම. |
| (ඊ) | ගිණුම්කරණ පද්ධතිය | 2013 වර්ෂයේ සිට ලංවීම මූල්‍ය ප්‍රකාශනවල පවතින ගිණුම්කරණ පද්ධතියේ අභ්‍යන්තර පාලන දුර්වලතා අඛණ්ඩව පැවතීම. | |